**සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම - 2016**

**------------------------------------------------------------**

2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනය සිදු කරගෙන යාම සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් මට සහාය විය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන
----------------

### 2.1 මතය
-------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2016 මාර්තු 31 දිනට සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 අවධාරණය කළ යුතු කරුණු
-------------------------------

2016 ඔක්තෝබර් 30 දින සිට බල පැවැත්වෙන පරිදි සමාගමේ මෙහෙයුම් නතර කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද තීරණය දැක්වෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 03 කෙරෙහි අවධානය යොමු කරමි. එබැවින්, මෙම මූල්‍ය ප්‍රකාශන කොටස් කරන ලද පදනමක් මත පිළියෙල කර තිබුණි. මෙම කරුණ සම්බන්ධයෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

### 2.3 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව
--------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ නියමය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවන්ට ඉදිරිපත් කර ඇති බවත්ය.

### 2.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්
-------------------------------------------

#### 2.4.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම
--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සමාගම රු. මිලියන 17,274 ක සමුච්චිත පාඩුවක් සහිතව රු. මිලියන 1,252 ක පාඩුවක් වාර්තා කර තිබුණි. තවද සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් රු. මිලියන 2,826 කින් ඉක්මවා තිබූ අතර, 2016 මාර්තු 31 දිනට සමාගමේ ශුද්ධ වත්කම් රු. මිලියන 2,797 ක සෘණ සංඛ්‍යාවක් වාර්තා කර තිබුණි. එබැවින් සමාගමේ වගකීම් සඳහා මහා භාණ්ඩාගාරයේ හා වෙනත් මූල්‍ය ආයතනවල මූල්‍ය සහාය නොමැතිව සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැක සහිතය.

(ආ) ණය හිමියන්ට හා සේවකයන්ට ගෙවිය යුතු මුදල් නිරවුල් කිරීම සඳහා සමාගම විසින් රු. මිලියන 3,300 ක හා එජඩො මිලියන 10 ක බැංකු ණය පහසුකම් ලබා ගෙන තිබුණි. ශ්‍රී ලංකා රජය විසින් මුදල් අමාත්‍යාංශය මගින් එම පහසුකම් සඳහා ප්‍රාරක්ෂණය (under written) කර තිබුණි.

**2.4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ (ශ්‍රීලංගිප්‍ර) ප්‍රමිතිවලට අනුකූල වීම**

**--------------------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) ශ්‍රීලංගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

**--------------------------------------------------**

රු. 231,375,026 ක හර ශේෂයක් සහිත වත්කම් ගිණුමක් හා රු. 1,167,446,104 ක බැර ශේෂයක් සහිත වගකීම් ගිණුමක් එකිනෙකට හිලව් කිරීමට නොහැකි නමුත් එසේ සිදු කර තිබුණි.

**(ආ) ශ්‍රීලංගිප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ**

**--------------------------------------------------**

සමාගම විසින් දැනට පාවිච්චි කරනු ලබන රු. 106,012,297 ක් පිරිවැය වූ සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද වත්කම්වල ප්‍රයෝජනවත් ජීව කාලය හා සුන්බුන් වටිනාකම පිළිබඳ තක්සේරුවක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා සිදුකර නොතිබුණි.

**(ඇ) ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ**

**------------------------------------**

සමාගමේ නිශ්චිත ප්‍රතිලාභ වගකීම පිළිබඳව සුදුසුකම්ලත් තක්සේරුකරුවකු මගින් ආයුගණක තක්සේරුවක් සිදු කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2016 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු. 80,315,098 කින් වැඩියෙන් දක්වා තිබුණි.

**(ඈ) ශ්‍රීලංගිප්‍ර 21 - විදේශ විනිමය අනුපාත වෙනස්වීමේ බලපෑම**

**-----------------------------------------------------------------------**

සමාගම විසින් එහි විදේශ විනිමය ගනුදෙනු සඳහා තත්කාලීන අනුපාතය (spot rate) යොදා ගත යුතුය. එම අනුපාත තථ්‍ය අනුපාතයට ආසන්න වේ නම් සියලු ගනුදෙනු සඳහා සාමාන්‍ය අනුපාතයක් යොදා ගත යුතුය. කෙසේ වුවද ආදායම හා වියදම හඳුනා ගැනීම සඳහා 2015 දෙසැම්බර් දක්වා සමාගම විසින් වෙනස් අනුපාත දෙකක් යොදාගෙන තිබූ බව නිරීක්ෂණය විය. ඊට අමතරව, සමහර ගනුදෙනු අදාළ නොවන විනිමය අනුපාතයක් යොදා ගනිමින් පරිවර්තනය කර තිබුණි.

**2.4.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**--------------------------------------**

රු. 7,425,000 ක් වූ ලැබිය යුතු මුදල් වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව ගිණුම්වල පැවතුණු අතර රු. 60,569,624 ක් වූ ගෙවිය යුතු හිඟ ශේෂයක් වර්ෂ 10 කට වැඩි කාලයක් නිරවුල් කිරීමෙන් තොරව ගිණුම්වල දක්වා තිබුණි.

**2.4.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**--------------------------------------**

රු. 25,605,758 ක් වූ ඇප තැන්පතු සඳහා සනාථ කිරීම් හා එකතුව රු. 152,576,764 ක් වූ ස්ථාවර වත්කම්වලට අදාළව සත්‍යාපන තොරතුරු කැඳවා තිබුණද, විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.5 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

-----------------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| **යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| (i) 7.3 ඡේදය | ටෙන්ඩර් පරිපාටි පිළිබඳ මාර්ගෝපදේශ සියලු රාජ්‍ය ව්‍යවසායයන් සඳහා නියෝගාත්මකය. කෙසේ වුවද, සමාගමේ ප්‍රසම්පාදන අත්පොත රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබූ අතර ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |
| (ii) 7.4.5 ඡේදය | සමාගමේ වත්කම් සත්‍යාපනය සිදු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල හා විශේෂ සමීක්ෂණ මණ්ඩල පත් කර නොතිබුණි. |
| (iii) 9.2 (ඇ) ඡේදය | සමාගමේ සංවිධාන සටහන හා අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියා පදිංචි කර නොතිබුණි. |
| (iv) 9.3.1 (i) ඡේදය | මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව අමාත්‍යාංශය විසින් සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) අනුමත කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

----------------------

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් වලින් වූ ප්‍රතිඵලය රු. මිලියන 1,252 ක බදු පූර්ව ශුද්ධ පාඩුවක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ බදු පූර්ව ශුද්ධ පාඩුව රු. මිලියන 1,381 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 129 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 141 කින් මූල්‍ය පිරිවැය අඩුවීම මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 සමාගමේ අගය එකතු කිරීම**

------------------------------

සේවක පාරිශ්‍රමික, ක්ෂය හා ක්‍රමක්ෂය පිළිවෙලින් රු. මිලියන 888 ක්, රු. මිලියන 13 ක් හා රු. මිලියන 42 ක් සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ අගය එකතු කිරීම රු. මිලියන 252 ක සෘණ අගයක් වී තිබුණි. ඉකුත් වර්ෂයේ රු. මිලියන 665 ක සමාගමේ අගය එකතු කිරීමේ සෘණ අගයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අගය එකතු කිරීමේ සෘණ අගය රු. මිලියන 413 කින් වැඩි වී තිබුණි.

## 3.3 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දළ ලාභ ආන්තිකය සියයට 1.84 ක් වුවද, ශුද්ධ ලාභ ආන්තිකය සියයට 10.25 ක සෘණ අගයක් ගෙන තිබුණි. විකුණුම් හා අලෙවිකරණ වියදම්වල සැලකිය යුතු වැඩිවීම සමාලෝචිත වර්ෂය තුළ දරන ලද ශුද්ධ පාඩුව සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාගමේ ශුද්ධ සෘණ අගය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණය ස්කන්ධ අනුපාතය සියයට 363 ක සෘණ අගයක් ගෙන තිබුණි. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ණය ගෙවා ගත නොහැකි බංකොලොත් භාවය හේතුවෙන් ණය හිමියන් සුරක්ෂිත නොවන බව එයින් දැක්වේ.

(ඇ) අහිතකර ණය ස්කන්ධ අනුපාතයට අමතරව, ජංගම අනුපාතය 0.72:1 ක් වූයෙන් සමාගමේ අහිතකර ද්‍රවශීලතා (කාරක ප්‍රාග්ධනය) තත්ත්වයක් එයින් දැක්වුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා ණය රැස් කර ගැනීමේ කාලය දින 39 ක් වූ අතර එය ඉකුත් වර්ෂයේ දින 41 ක් විය. එබැවින් ණය රැස්කර ගැනීමේ සුළු වර්ධනයක් සිදු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව, මූලික අරමුණු වනුයේ, දේශීය හා ජාත්‍යන්තර ගුවන් සේවයක් හෝ ගුවන් ප්‍රවාහන කාර්යයක් ලෙස එම ව්‍යාපාර සිදු කිරීම සහ මගීන් හා නැව්බඩු සඳහා ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කිරීමයි.
සමාලෝචිත වර්ෂය තුළ ඉහත අරමුණු ඉටුකර ගැනීම පිළිබඳව පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඉටු කිරීම සඳහා අපේක්ෂිත ඉලක්ක සමාගම විසින් සකස් කර නොතිබුණි. කෙසේ වුවද විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාගමේ තථ්‍ය ප්‍රගතිය සාරාංශ කර පහත දැක්වේ.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | 2015/16 | 2014/15 | 2013/14 | 2012/13 | 2011/12 |
|---|---|---|---|---|---|
| මගී ධාරිතාවය (ASK මිලියන) | 1,822 | 1,675 | 1,850 | 1,395 | 1,102 |
| ගෙන යන ලද මගීන් (RPK මිලියන) | 1,363 | 1,216 | 1,404 | 1,050 | 797 |
| සමස්ත ධාරිතාවය (ATK මිලියන) | 208 | ඉදිරිපත් කර නොතිබුණි | | | 110 |
| ගෙනයන ලද සමස්ත පැටවීම් ප්‍රමාණය (RTK මිලියන) | 148 | | | ඉදිරිපත් කර නොතිබුණි | |
| සමස්ත පැටවීම් සාධකය (%) | 75 | 73 | 76 | 75 | 72 |
| ගෙනයන ලද මගීන් (දහස්වලින්) | 595 | 463 | 511 | 401 | 351 |
| ගෙනයන ලද නෞභාරය (ටොන්වලින්) | 4,764 | 3,435 | 3,134 | 2,504 | 1,808 |

(ආ) ඉකුත් වර්ෂයට සාපේක්ෂව මගීන් ආදායම, අතිරික්ත ගමන් බඩු ආදායම හා නෞභාර ආදායම පිළිවෙලින් සියයට 16 කින්, සියයට 32 කින් හා සියයට 41 කින් වැඩි වී තිබුණි. නව නැවතුම් ස්ථාන 4 ක් එනම් MCT (මස්කට්), MAA (චෙන්නායි), CCU (කල්කටා), හා MLE (මාලේ) හඳුන්වා දීම හා ඩකා ගුවන් තොටුපළට අදාළව ගුවන් යානා සංඛ්‍යාතය වර්ධනය වීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 4.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

2016 ඔක්තෝබර් 01 දිනට සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 302 ක් විය. සමාගමේ මෙහෙයුම් අත්හිටු වීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද තීරණයෙන් පසුව, ඔවුන්ගෙන් සේවකයන් 125 දෙනෙකු ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට බඳවා ගෙන තිබුණි, සේවකයන් 168 දෙනෙකු ස්වේච්ඡාවෙන් විශ්‍රාම යන ලද අතර ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රු. මිලියන 165.22 ක් විය. තවද සේවකයන් දෙදෙනෙකු තවදුරටත් සමාගමේ සේවය කරන අතර උපදේශකවරුන් 07 දෙනෙකු සමඟ වූ කොන්ත්‍රාත්තු 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් විය. කෙසේ වුවද ස්වේච්ඡා විශ්‍රාම යෝජනා ක්‍රමය (VRS) යටතේ සේවයෙන් විශ්‍රාම ගන්නා ලද සේවකයන් 06 දෙනෙකු 2017 ජනවාරි 01 සිට 2017 ජුනි 30 දක්වා මාස 06 ක කාල පරිච්ඡේදයකට යළි බඳවා ගන්නා ලදී.

# 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | - භාණ්ඩ සමීක්ෂණ/ වත්කම් සත්‍යාපනය සිදු කර නොතිබුණි. |
| | - වත්කම්වල සංකේත යොදා නොතිබුණි. |
| (ආ) ගිණුම්කරණය | - ජර්නල් සටහන් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා පාලන ක්‍රම නොමැති වීම. |
| | - නොසැසඳු ගිණුම්/ වාර්තා |
| | - ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | - දිගුකාලීන ලැබිය යුතු හා ගෙවිය යුතු හිඟ මුදල් පැවතීම. |
| (ඈ) සැලසුම්කරණය හා පාලනයන් | - අතාත්වික අයවැය ඉලක්කයන් |